// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2141/92 - 2019 සැප්තැම්බර් මස 22 වැනි ඉරිදා - 2019.09.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳ පනත

8 වන වගන්තිය යටතේ දැනුම් දීමයි

1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීමේ පනතේ 2 වගන්තිය යටතේ නියමය අංක 2141/25 හා 2019 සැප්තැම්බර් මස 18 වැනි බදාදා දිනැති අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකර ඇති අතර එකී නියමය පළ කරන ලද දිනය වූ 2019.09.18 දිනයත් නාමයෝජනා කිරීමේ දිනය වූ 2019.10.07 දිනයට පෙර දිනය වූ 2019.10.06 දින මධ්‍යාහ්න දොළහට පෙර හෝ අතර වූ කාලය තුළ කාර්යාල දිනවල දී පෙ.ව. 8.30 සිට ප.ව. 4.15 දක්වා ද 2019.10.06 වන ඉරිදා දිනයේ දී පමණක් පෙ.ව. 8.30 සිට මධ්‍යාහ්න 12.00 දක්වා ජනාධිපතිවරණය සඳහා අපේක්ෂකයෙකු විසින් හෝ අපේක්ෂකයෙකු වෙනුවෙන් යම් තැනැත්තෙකු විසින්,

(අ) ඒ අපේක්ෂකයා පිළිගත් දේශපාලන පක්ෂයක් විසින් නාම යෝජනා කරන ලද අපේක්ෂකයෙකු වන අවස්ථාවක, වලංගු මුදලින් රුපියල් පනස් දහසක් වූ මුදලක් ද ;

(ආ) ඒ අපේක්ෂකයා වෙනත් යම් දේශපාලන පක්ෂයක් විසින් හෝ ඡන්ද හිමියෙකු විසින් හෝ නාමයෝජනා කරන ලද අපේක්ෂකයෙකු වන අවස්ථාවක වලංගු මුදලින් රුපියල් හැත්තෑපන්දහසක් වූ මුදලක් ද ;

මැතිවරණ කොමිෂන් සභාව වෙත හෝ තත්කාර්යය සඳහා මැතිවරණ කොමිෂන් සභාව විසින් බලය පවරන ලද යම් තැනැත්තෙකු වෙත හෝ රාජගිරිය, සරණ මාවතේ පිහිටි මැතිවරණ කොමිෂන් සභා කාර්යාලයේ දී ඇප වශයෙන් තැන්පත් කළ යුතු ය. නැතහොත් ඇප වශයෙන් තැන්පත් කිරීමට සැලැස්විය යුතු ය.

මහින්ද දේශප්‍රිය
සභාපති
මැතිවරණ කොමිෂන් සභාව

එන්. ජේ. අබේසේකර
සාමාජික
මැතිවරණ කොමිෂන් සභාව

එස්. රත්නජීවන් එච්. හූල්
සාමාජික
මැතිවරණ කොමිෂන් සභාව

2019 සැප්තැම්බර් මස 22 වැනි දින,
කොළඹ දී ය.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*